# පුංචි හොරෙක්



සෙනුලි රශ්මිතා මෙනන්

# පුංචි හොරෙක්

සෙනුලි රශ්විතා මෙනන්

**වෙනත් කෘති**

- අපේ සීයා තාත්තා සුරංගනා ලෝකයට ගිය හැටි
- සමනල කඩය
- බිය වුන පූස් රාළ
- ඔයයි මමයි
- සූර වීර යකා පැංචා
- All about me

2025 February 08

ISBN 978-624-208-204-2

# පිදුම

මට හැමදා ආදරේ කරන අම්මා, තාත්තා, නංගී ඇතුළු පවුලේ සියලු දෙනාටත්, මගේ සියලුම යහළුවන්ටත් මට අකුරු කියවූ චන්ද්‍රලතා ගුරු මෑණියන්ටත්, චම්පිකා ගුරු මෑණියන්ටත්, නිල්මිණී ගුරු මෑණියන්, සහ කුමුදිනි ගුරුමෑණියන් ඇතුළු මට සිප් කිරි පෙවූ සියලු ගුරු මෑණිවරුන් සහ පියවරුන්ටත් ග්‍රන්ථකරණය සඳහා නිරන්තරයෙන් අප දිරිමත් කරන සෙනෙවිරත්න ගුරු පියාණන් සහ අපගේ විදුහල්පතිතුමියට මාගේ මේ කෘතිය වන "**පුංචි හොරෙක්**" බැති සිතින් පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත් වීම සුවිශේෂී සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුල යලි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන ''හෙරණගත්කරණී'' ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

# පුංචි හොරෙක්

''අනේ දැන්වත් සෙල්ලම් කරන්න එනවද අක්කා?'' නංගී කිවුවා. ''තව පොඩ්ඩයි නංගී එතකොට ඉවරයි.'' මම දෙමළ පන්තියට පරිගණකයෙන් සම්බන්ධ වෙන ගමන් නංගීට එහෙම කිව්වේ, ''සෙල්ලම් කරන්න එන්න'' කියන වදේ ඉවසගන්නට බැරිවයි. එයා කොච්චර කිව්වත් මට පන්තිය නවත්තලා යන්න බැහැ නේ. මොනවා වුණත් පන්තිය ඉවර වෙලා මට සෙල්ලම් කරන්න වෙන්නෙත් නෑ. මොකද ඉස්කෝලෙන් ගෙදර වැඩ දුන් නිසා. පව් නංගී. හැබැයි දෙමළ පන්ති සිකුරාදාට විතරයිනේ. සෙනසුරාදාට කරන්න වැඩ පුරව ගන්නත් බෑ. සෙනසුරාදාට කරාටේ තරඟ තියන නිසා.



''වනක්කම් පිළ්ළෛහල්!'' ඇති යන්තන් පන්තිය ඉවර වුණා. ''දැන් එනව ද සෙල්ලමට'' නංගී ඇසුවා. ''නංගී ගෙදර වැඩ කරලා එන්නම්''

''අයියෝ''

''හෑයියා'' එකපාරටම අම්මා කෑ ගැසුවා. ''ඇයි අම්මා කෑ ගහන්නේ'' මමයි එහෙම ඇහුවේ. ''නෑ මොනවත් නෑ මැණික ඔයා වැඩේ කරන්නකෝ.'' අම්මා කිව්වා.

''හෑයියා'' අම්මා ආයෙමත් කෑ ගැහුවා.

''අනේ ඇයි අම්මා''

''අයියෝ මැණික මම පුටුව පිටිපස්සෙන් නැට්ටක් දුවනවා වගේ දැක්කා'' අම්මා කිව්වා. ''අනේ අම්මා බය වෙන්න එපා'' නංගී එහෙම කිව්වේ එයා කිසිම දේකට බය නෑ වගේ. ''ඒ හූනෙක් වෙන්න ඇති''. ''ඒ හූනෙක් වෙන්නේ කොහොමද අක්කා? කතාවක් තියෙනවා නේද හැට පැන්නත් හූනෝ බිමින් යන්නේ නෑ කියලා.'' නංගී තමයි එහෙම කිව්වේ. ''අයියෝ! ඒ වළුරොනේ අනේ. ඕකවත් දන්නේ නැද්ද?'' ''ඔව් ඔව් ඉතින් අක්කා හැමදේම දන්නවානේ''

''කෑ ගහන එක නවත්වන්න''. අම්මා එහෙම කියලා වාඩි වෙලා හිටපු පුටුවෙන් නැගිටලා හොඳට බිම බලාගෙන ඇවිද්දා. ''අෑ... අෑ... අම්මේ මීයෙක් මීයෙක්'' කියාගෙන අම්මා පුටුව උඩ නැගගත්තා. ''ඌයියා'' කියාගෙන නංගී පුටුවට නැග්ගා. ''මීයෙක් මීයෙක්'' මම මේසේ උඩට නැග්ගා. මම මේසය උඩ. නංගීයි අම්මයි පුටුව උඩ. ''හෙලවෙන්න තියා බිමට බහින්නවත් එපා'' අම්මා කිවුවා. ''අම්මා මීයෝ කකුල් හපනවා ද?''නංගී ඇහුවා. ''නෑ නෑ අනේ''

''අන්න මීයා ජනේලයේ තිර රෙද්ද ළඟට දුවනවා.'' නංගී කිවුවා. මම පාඩම් කරන මේසය තිබුණේ ජනේලය ළඟමයි. මම හොඳට ම බය වුණා. මම මේසේ උඩ ඉඳලා ඇස් දෙක වහගෙන මෙහෙම කිවුවා. ''මම බොහොම බය වුණා මට පණ එපා වුණා, සවස අටට මී පැටියට මාව අහුවුණා.'' ''අෑ... අෑ... අයියෝ බේරගන්න'' මම මේසේ උඩ දුවමින් කිවුවා. ''අනේ බොරුවට කෑ ගහන්න එපා. මීයා මේසය උඩට එන්නේ නෑ.'' තාත්තා ගෙදර එන්න රෑ දහයවත් වෙනවා. තාත්තා මීයන්ට බය නෑ. අම්මා දුරකතනයෙන් තාත්තාට කතා කළා. ''අනේ මේ, මීයන්ට තිර රෙදි දිගේ උඩට නගින්න පුලුවන් ද?'' අම්මා ඇහුවා. මීයෝ සාමාන්‍යයෙන් බිම නේ යන්නේ? තාත්තා කිවුවා. ''අහන දේට උත්තර දෙන්නකෝ'' අම්මාට ටිකක් තරහා ගියා. ''මට හිතෙනවා නගින්න පුළුවන් ඇති කියලා. කොහොම වුණත් ඇයි එහෙම ඇහුවේ''


''මේ ගේ ඇතුළට මීයෙක් පැනගෙන'' අම්මා දුකෙන් කිවුවා. ''මොනවා අදියි ද දන්නේ නෑ'' හරි තියන්නන්. තාත්තා කිවුවා.

''දැන් හෙමීට අපි මීයා තිර රෙද්දේ ඉන්නවා ද බලමු'' අම්මා එහෙම කිවුවා. ''මැණික ගිහින් කොස්ස අරන් එන්න'' නංගී දුවලා ගිහින් කොස්ස ගෙනාවා. අම්මයි, නංගියි මේසය ළඟට ඇවිත් මට එකතු වුණා. අම්මා කොස්සෙන් තිර රෙද්ද සෙලෙව්වා. මොනවත් වුණේ නෑ. ''මැණික තිර රෙද්දට ගහන්න මොනවා හරි ගේන්නකෝ'' අම්මා කිවුවා.

මම නංගී එක්ක ගිහින් රෝස පාට හැන්දක් ගෙනාවා. අම්මා ඒක තිර රෙද්ද ළඟට වීසි කළා. මොනවත් නෑ. ඉතිං නංගීයි මමයි ගෙදර වැඩ කළා. නංගී මට උදවු කළා. අම්මා පුටුවේ වාඩි වෙලා කකුල් උඩට අරගෙන පොතක් කියෙව්වා. ''තව ටික වේලාවකින් අපි මීයා ඉන්නවා ද කියලා බලමු''. අම්මා ඇවිල්ලා තිර රෙද්ද යට බැලුවා. ''මට මී නැට්ට පේනවා. උඟට මොනවා හරි වෙලාද කොහෙදෝ'' අම්මා බය වෙලා වගේ කිවුවා. ''අයියෝ අම්මා ඒ අපි විසික් කරපු හැන්දනේ'' නංගියි මමයි හිනා වෙවී කිව්වා. ''හරි ගෙදර වැඩත් කරලා ඉවරයි'' මම සතුටින් කිවුවා. ''හරි දැන් දෙන්නම හෙමීට එන්න ඇඟ හෝදන්න යමු'' අම්මා කිවුවා.

අපි බයෙන් බයෙන් පඩිපෙළ නගිමින් උඩු මහළට ගියා. මම මුලින්ම නාන කාමරය ඇතුළට ගියා. ''අම්මා මීයන්ට පඩිපෙළ නගින්න බැහැ නේද?'' මම එහෙම ඇහුවා. ''හෑයියා'' නංගියි අම්මයි නාන කාමරයට දුවලා ඇවිත් දොර වැහුවා. ''මීයා මෙහෙටත් ඇවිත්'' අම්මා කිවුවා. ''මීයන්ට පඩිපෙළ නගින්න පුළුවන්'' අම්මා කිවුවා. අම්මා ටිකක් දොර ඇරලා බැලුවා. ''මීයා ඇඳ ළඟට දිවුවා'' අම්මා කිවුවා. ''මැණික ඔය දෙන්නා දුවලා ගිහින් ඇදට නගින්න. ඊට පස්සේ මම එන්නම්.'' ''අම්මා මම ඇඟ හේදුවේ නැහැ නේ'' නංගී කිවුවා. ''ඔයා ඉක්මනට ඇඟ හෝදගෙන එන්න.'' අම්මා කිවුවා.

නංගී ඇඟ හේදුවාට පසුව අම්මා කියපු විදිහට අපි ඇඳට නැඟ ගත්තා. අම්මත් ඇඟ හෝදගෙන දුවලා ආවා. අපි ඇඳේ ඉන්න කොට මීයා නාන කාමරයට රිංග ගත්තා. ''දැන් අපි මොනවද කරන්නේ'' නංගී ඇහුවා. ''අම්මා අපි මීයව දාලා දොර වහමු.'' මම කිවුවා. ''හොඳ අදහස, ඒත් කවුද දොර වහන්නේ'' අම්මා ඇහුවා. ''අම්මා දොර වහන්න'' නංගී කිවුවා. ''මට දොර ළඟට යන්න බයයි'' අම්මා කිවුවා. ''අම්මා අපි අර ලොකු කුඩේ මිටේ තියන කෙක්ක වගේ එකෙන් අල්ලලා දොර වහමු''



''හරි අපි එහෙම කරමු'' අම්මා කිවුවා. නංගී පහළ මහලට ගිහින් කුඩය ගෙනාවා. අම්මා දොර වැහුවා. ''අපි මේක තාත්තට කියමු'' අම්මා කිවුවා. ''පොඩ්ඩක් ඉන්න අයියෝ මගේ ෆෝන් නාන කාමරේනේ'' අම්මා කිවුවා. ''අපි එහෙනම් ලෑන්ඩ් ලයින් එකෙන් කතා කරමු'' නංගී කිවුවා.



''හලෝ තාත්තා''

''ඔව් පුතේ''

''තාත්තා අර මීයා, අපි උඌව නාන කාමරේට දාලා දොර වැහුවා''

''හරි ම හොඳයි දැන් මට ලේසියි'' හරි තියන්නන් තාත්තා. අපි කාලා නිදා ගන්න ගියා. උදේ අපි නැගිට්ද්දී තාත්තා මීයා ව අරගෙන ගිහින් ''තාත්තා මීයා කෝ?'' මම ඇහුවා. ''පුතේ මම ඊයේ රෑ මීයා අල්ලා ගන්න කාමරේ ඇතුළට ගියා. පව් උඌ බය වෙලා. මට උඌව දකිද්දී ඔය දෙන්නාව මතක් වුණා. උඌ දුවලා ගිහින් කුණු බක්කියට පැන්නා. උගේ හිතේ මට උඌව පේන්නේ නෑ කියලා. මම හිමීට උඌව මල්ල පිටින් අරන් ගිහින් පල්ලෙහා වත්තට දැම්මා.

මේ අපූරු සිද්ධිය විතරක් නෙමෙයි. මේ පුංචි හොරු නිසා තවත් ජරමර ගොඩක් වෙලා තියෙනවා. අපේ ගේ වටේටම පුංචි කැලෑවක් තියෙනවා. ඒකේ ඉන්න පුංචි පුංචි මී යාළුවෝ තමයි අපේ ගෙට සැරින් සැරේට ගස්වල අතු දිගේ ඇවිත් රිංගන්නේ. ඒ වේලාවට අම්මාට යකා නගිනවා. මටත් තරහා යනවා. නංගීට නම් තව ම ගානක් නෑ. එයා පොඩියි නේ. මොනවා වුණත් මුළු ගෙදරම වනසන මේ මී කරදරේ ගැන මම දැන් කියන්නම්.



මේ මී හොරු ටික රෑ තිස්සේ හොරෙන් පඩිපෙළ යට ඉදන් කුස්සියට රිංගා ගන්නේ හරිම උපක්‍රමශීලිව. අපි සියලු දෙනා රෑට විදුලි පන්දම් නිවා නින්දට ගිය විට සිදු වන දෑ බොහෝයි. ඒ කිසි ම දෙයක් අපි නොදනිමු. නමුත් සමහර දිනවල උදෑසන අපි නැගිටින විට කුමක් හෝ අඩුපාඩුවක් තිබේ. අපි එයට හේතුව හොඳින් දන්නෙමු. එක් දිනක මම උදේ නැගිටින විට අම්මා කෑ ගසමින් සිටියා ය. ''අයියෝ කඩල ටින් එකත් ඉවරයි'' මම දුවලා ගිහින් බැලුවා. කඩල ටින් එකේ මූඩිය හපලා. හිල් කරලා තිබුණා. ඒ තමයි මේ මී කරදර වැලේ ආරම්භය.


තවත් දවසක් අත්තම්මා මිරිස් හොද්දක් හදන්න මිරිස් කරල් දමා තිබුණු මිරිස් මල්ල සෙලෙව්වා. මිරිස් කරල් ටික ඔක්කොම හපලා තිබුණොත් මේ හොරු ටිකම තමයි.

මේ මී හොරු අපිට කරදර කළේ ගෙදර දී විතරක් නෙවෙයි. අපේ නංගියා එක වසරේ ඉගෙන ගන්න කාලයේ පන්තියේ දාලා ඇවිත් තිබුණු කෑම පෙට්ටිය ගන්න ගිය වෙලාවේ ඒ මල්ලෙ හිටිය මී තඩියා අම්මාගේ අත හපපු නැති ටික විතරයි.

ඒ වගේම අපි නිවාඩුවකට ගිහින් එනකොට හාල් පෙට්ටිය ඇතුළෙත් එක මීයෙක් මැරිලා හිටියා. තවත් හොඳ කතාවක් තියෙනවා. අපේ ගෙදර එළියේ තිබෙන වතුර භාජනය ළඟ තිබුණු සබන් කැට එක දිගට දවස් හතරක් නැති වුණා. මේකෙන් අදහස් වෙන්නේ මීයන් කන්නේ නැති දෙයක් නෑ කියන එකයි. ප්ලාස්ටික්, පොලිතීන්, පොත්, රෙදි, රබර්, සබන් එයාලට ඒවා හරිම රසවත් කෑම. මීයන් එක එක තැන්වලින් ගෙදරට පනිනවා. වහලෙන්, දොරෙන්, ජනේලයෙන්. පුංචි නිසා ඕනෑ ම තැනකට රිංග ගන්න ඒඅ යට පහසුයි. අපේ ගෙදර ගොඩක් බඩු නැති වෙන්නෙත්, නාස්ති වෙන්නෙත් මීයන් නිසා.



සමහර වේලාවට මේ මී කරදරේ වදයක් වෙනවා. ඒ වේලාවටනම් උගුලක් අටවන්නම වෙනවා. මම කලින් ම කියපු කතාවෙ නම් කුණු බඳුනට දාලා තිබුණු පොලිතීන් බෑගයෙන්ම අරගෙන ගැට ගහලා මීයාව වත්ත පහළට දැම්මා. නමුත් අනෙක් දවස්වල නම් අපි මීයන් ඇල්ලුවේ වෙනස්ම විදිහකටයි. අපි ගෙදර මීයන් ගැවසෙන බව පළමුව ම දැන ගත් දවස්වල මොනවත්ම කරන්න බැරිවයි හිටියේ. ඒ කාලයේ මීයන් ගෙදර රජ කළත් අපි අන්තිමට දිනුවා. අම්මා කිවුවා මී කතුරක් ගමු කියලා. මීයට හානි වෙන දේවල් කරන්න බෑ කියලා තාත්තා කිවුවා. තාත්තා ඉතින් සතුන්ට පණ වගේ ආදරෙයිනේ. මට නම් තේරුණේ නෑ මී කතුරකින් මීයට වෙන හානිය.



කොහොම වුනත් මට මී කතුර හරියන්නේ නෑ කියලා හිතුනේ මගේ නෑදෑ නංගීට වෙච්ච වැඩෙන්. එයාලගේ ගෙදරත් මීයෝ රජ කරලා. ඉතින් බාප්පා මී කතුර රෑක ගෙදර ඇතුළේ තියලා. මීයා අහුවෙලා. ඉතින් පස්සේ උඌව ගිහින් දාන්න හිතාගෙන ගෙදරින් එළියේ ගෙවත්තේ තියලා ගිහිල්ලා. සවස ඇවිල්ලා බලනකොට මීයව කන්න කියලා හිතාගෙන ඇවිල්ලා තිබුණු ලොකු ඇටි කුකුළෙකුත් මී කතුරට අහුවෙලා. මී තඩියා හොඳටම බය වෙලා. මීයයි ඇටි කුකුළයි එහෙට මෙහෙට දඟලලා. මුළු ගෙදරම ජරමරයක්.




VIM
choco
choco
choco
BIN
Pepper
Salt

කොහොම හරි අන්තිමට අපේ තාත්තාට හොඳ උපායක් පහළ වුණා.

තාත්තා කඩේ ගිහින් පුංචි මී කූඩුවක් ගෙනාවා. තාත්තා කියපු විදිහට කූඩුව ඇතුළේ තියන කම්බියට මීයන් කන්නට කැමති කෑමක් සවි කරාම, උං ඒක කන්න කම්බියෙන් ඇදලා කෑවම කූඩුවේ දොර වැහෙනවා එතකොට මීයටත් හානියක් නෑ. උං අපේ අතේ. අපි කීප දවසක්ම කම්බියට කරවල හා පොල් කෑලි සවි කරලා තිබ්බා. පළමුවෙනි දවස් කිහිපයේ නම් එක මීයෙක්වත් අසු වුණේ නැහැ. අපිට හිතුණේ මේක වැඩක් නෑ කියලා. ඒත් ටික දවසකින් එක පිට එක මීයෝ අසුවෙලා හිටියා. හරි පුදුමයි. ඉතින් මේ විදිහට මීයෝ අල්ලනවට නංගියි මමයි හරි ආසයි.







තාත්තා සවසට උඹව ගිහින් දානකන් අපි උඹව හුරතල් කරනවා. නංගි කිවුවා එයා ආසම උන්ගේ පාටවලට කියලා. දුඹුරු, සුදු, කළු ඔය හැම පාටකින්ම මීයන් අපට අහුවුණා. උන්ගේ පුංචි රෝස පාට නහය වගේම දිලිසෙන පුංචි ඇස් නිසා උන්ට ලැබෙන්නේ හුරුබුහුටි පෙනුමක්. අපි උන්ට කන්නත් දීලා තියෙනවා. බත්, චීස් එහෙම දුන්නාම ආයේ පොඩ්ඩක්වත් ඉතුරු වෙන්නේ නෑ. මං ළඟ තියන පුංචි සෙල්ලම් බෝල, කූඩුව ඇතුළට දැම්මා ම උන් ඒක පස්සේ දුවනවා. මම උන්ට පුංචි සෙල්ලම් බඩුවකුත් හැදුවා. පුංචි කුරුලු පිහාටුවක් නූලකින් පෑනකට සවි කළාම උන් ඒක අල්ලන්න හදනවා. ඒ වගේම වෙලාවකට දුක හිතෙන දේවලුත් වෙනවා. කොහේවත් යන කපටි බළල් රාළලා කූඩුවේ දොර ඇරලා මී පැටවුන්ට ගිල දාපු වෙලාවලුත් තියෙනවා. එතකොට අපි අඬනවා. කොහොම හරි දවස අවසානයේදී තාත්තා කාර් එකේ නැගලා මීයව අරන් ගිහින් තාත්තා වැඩ කරන තැන කුරුණෑගලදී බස්සනවා.

දැන් මට දැනුණු දෙයක් කියන්නම්. මීයා ගිහින් දානකොට මට පොඩි දුකකුත් ඇති වුණා. උඹට කරදරයක් වෙයි කියලා හිතුණා. හැබැයි උන් බේරෙන හැටි දන්නවා කියලා අම්මා කියනවා. පිටරටවල් වල නම් මීයන් ඇති කරනවා. ඒත් වල් මීයෝ නෙවෙයි, ඒ හැම්ස්ටර් මීයන්ය. මම කලින් කියපු සිදුවීමට පස්සේ දවසේ උඩු මහලේ ඇරුණු කොටසේ පහන් පත්තු කරන්න ගියේ පොසොන් පොහොය නිසයි. එතකොට මම ගස් අතු අතරින් මී පැටවුන් දුවනවා දැක්කා. ඒ කියන්නේ ඒ ගොල්ලෝ තාම ඉන්නවා.

මේ විදිහට අපි මීයන් එක දිගටම ඇල්ලුවා. අපි එක දවසක මීයෙක් අල්ලලා ගිහින් දැම්මා ම තවත් මීයෙක් ඊළඟ දවසේ ගෙදර රජ කරන්න පටන් අරගෙන. මීයෝ ඉන්නෙත් නෑ. යන්නෙත් නෑ. හරිම වදයක් වෙනවා. තාත්තා මීයන් අල්ලාගෙන ගිහින් කුරුණෑගලට දාන්නේ තාත්තා කුරුණෑගල වැඩ කරන නිසා. එතකොට ලේසියිනේ.

මට නම් හිතෙන්නේ දැන් නම් මීයෝ ගිහින් දාලම කුරුණෑගල මීණෑගලක් වෙයි කියලා. හැබැයි ඉතින් තාම තාත්තාගෙන් ඒ පැත්තේ මී උවදුර ගැන ආරංචියක් නම් හම්බ වුණේ නෑ.




කොහොම වුණත් කමක් නෑ. මම දැන් නංගි මට කියපු කතාවක් කියන්නම්. නංගී කියන විදිහට මීයන් අපිට වටිනවා. එයා කියන්නේ අපිට කුණු කසල දාන්න තැනක් නැතිව ඉන්න කොට, පිලිස්සීමට හෝ නොහැකි විට මීයන් ඇවිත් ඒවා කා දැමූ පසු අපිට ඒ ගැන සිතීමට අවශ්‍ය වන්නේ නැහැ කියලයි. නංගීට නම් මීයන් වීර සතුන්. මමත් මීයන්ට ආසයි. නමුත් බයයි.

මගේ හොඳම යාළුවා මියුරු හරිම නුවණක්කාර කෙනෙක්. එයාට අහුවෙන සෑම මීයෙක්ම ලා දුඹුරු පාට පුංචි රතු පාට නහයක් තිබෙන හුරුබුහුටි මී පැටවුන්ලු. එයා එක දවසක් අහුවුණු මීයාගේ පිටේ ලා නිල් පාට තීන්තවලින් ඉරක් ඇඳලා. ඊළඟ දවසේ තවත් මීයෙක්ව අහුවෙලා. බලද්දී උගේ පිටෙත් ලා නිල් පාට ඉරක්ම තියෙනවාලු. ඒ කියන්නේ මියුරැලාගේ ගෙදරට හැමදාම ඇවිල්ලා තියෙන්නේ එකම මී රාළ හාමි තමයි.



මේ පුංචි හොරුන්ගෙන් අපිට කවදාවත් බේරුමක් නැති වෙයිද? එක හොරෙක් යනකොට..... තව හොරෙක් එනවා.....




— නිමි —



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවක් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් භික්ෂුන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක් වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩ නගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක
සෙනෙවිරත්න මහලේකම්